**දිළිදුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය - II ව්‍යාපෘතියේ සහ දිළිදුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය - II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල - 2013**

---

දිළිදුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය - II ව්‍යාපෘතියේ සහ දිළිදුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය ,හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීම් තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ,ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව (ජා.ස.ජ.බැං.) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර 2008 ජූලි 29 දින එළඹි අංක එස් එල් -පී 94 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය**

---

දිළිදුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය - II ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව ,ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ දිළිඳු ජනතාවගේ ආදායම් මට්ටම් ඉහළ නැංවීම සහ ආදායම් උත්පාදන කටයුතු සඳහා ණය සැපයීම මගින් ඔවුන් සඳහා විධිමත් මූල්‍ය සේවා වර්ධනය කිරීම ඇතුළත්ව , සහභාගීත්ව මූල්‍ය ආයතන (ස.මූ.ආ.) සහ හවුල්කාර නියෝජිතායතනවල (හ.නි.) කළමණාකරන හා පුහුණු ධාරිතාවයන් වර්ධනය කිරීම සහ ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම හා ප්‍රතිලාභීන්ගේ කුසලතා වර්ධනය කිරීම තුළින් දිළිදුකම දුරලීම, ප්‍රාදේශිය අසමානතාවන් දුරු කරලීම සහ සාමය ගොඩනැගීම සඳහා සහයෝගය ලබා දීම වේ .ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 2,759 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 2,575 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව එකඟ වී ඇති අතර මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතිපාර්ශවීය අරමුදල් වශයෙන් රු.මිලියන 372 ක් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් 2013 වර්ෂයේදී විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා මගින් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයෙන් කරන ලද ඉල්ලීමට අනුව ණය ගිවිසුමේ උපලේඛන 2 හි 2 වගන්තියේ 1 උපවගන්තිය ප්‍රකාරව අරමුදල් නැවත ප්‍රතිපාදනය කිරීමට එකගතාවය ලබා දී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2009 ජනවාරි මාසයේදී ආරම්භ කළ අතර ණය ගිවිසුමේ 1 උපලේඛනයේ 3 වගන්තිය අනුව 2013 දෙසැම්බර් මාසය වනවිට අවසන් වීමට නියමිතව තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ කාලය 2015 නොවැම්බර් 12 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමණාකරනයේ වගකීම වේ.වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම සහ පවත්වාගෙනයාමත් ,යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමත් ,අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**2. <u>විගණකගේ වගකීම.</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ

සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගණුදෙනු වත්කම්,වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීමද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම , මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව,

(ආ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව,

(ඉ) විශේෂ යෙන් ගිණුමේ ආරම්භක ශේෂය හා අවසන් ශේෂය, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌනපූර්ණයන් ව්‍යාපෘතියේ මගින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය , එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

## 3. <u>මතය</u>

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය -II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය - II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බව මා දරන්නා වූ මතය වේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2103 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ යෙන් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමින් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව ,සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය ,එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.)කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමණාකරනය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත් ය.

**4.** <u>මුල්‍ය ප්‍රකාශන</u>

**4:1** <u>මුල්‍ය කාර්ය සාධනය</u>

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන සහ තොරතුරු වලට අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මුළු වියදම රු.261,487,585 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ වියදම රු.732,089,815 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම, ඉකුත් වර්ෂයේ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විස්තරය** | **2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | **රු.** | **රු.** | **රු.** |
| සහභාගීත්ව මුල්‍ය ආයතන සඳහා ප්‍රති මූල්‍ය ණය ලබාදීම | 201,521,500 | 651,357,800 | 2,880,070,300 |
| උපකරණ | - | 13,831,039 | 13,831,039 |
| පොළී හා බැදීම් ගාස්තු | 18,740,103 | 18,914,439 | 58,585,531 |
| පරිපාලන වියදම් | 41,225,982 | 47,986,537 | 157,051,627 |
| **එකතුව** | 261,487,585 | 732,089,815 | 3,109,538,496 |

ණ
ය
ගි
විසුමේ 1 උපලේඛනයේ 2 වගන්තිය ප්‍රකාරව 2008-2013 කාලපරිච්ඡේදය සඳහා වෙන්කළ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ජපාන යෙන් මිලියන 2,572 ක් විය. එසේ වුවත් 2013 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රතිපාදනයෙන් සිදුකර තිබුණු මුළු වියපැහැදම් ප්‍රමාණය ජපාන යෙන් මිලියන 2,149 ක් එනම් මුළු වෙන්කිරීම් වලින් සියයට 84 ක් විය. ඉහත ප්‍රතිපාදනයෙන් ජපාන යෙන් මිලියන 2,100 ක් ණය ලබා දීම සඳහා ප්‍රතිපාදනය කර තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට එහි සත්‍ය උපයෝජනය ජපාන යෙන් මිලියන 2,099 එනම් සියයට 99.5 ක් විය. උපදේශන සහ ධාරිතා සංවර්ධන සංරචකය යටතේ දරණ ලද

වියදම (ජපාන යෙන් මිලියන 30.8ක්) ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය මගින්2014 වර්ෂයේදී ප්‍රතිපූරණය කර තිබුණි.

එබැවින්, උපයෝජනය නොකළ ණය වලින් ජපාන යෙන් මිලියන 205 ක් වෙන්කර උපදේශක සේවා හා ධාරිතා සංවර්ධන සංරචක සඳහා 2014 ජනවාරි මාසයේදී නැවත ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

**4:2 <u>විශේෂ යෙන් ගිණුම</u>**

ඉදිරිපත් කරන ලද තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශනවලට අනුව,ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ විශේෂ යෙන් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂය තුලදී කරන ලද ගනුදෙනුවල සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | **ජපන් යෙන්** | **රු:** |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | නැත | නැත |
| එකතු කලා : | | |
| ඌන පූර්ණය කිරීම් | 96,838,244 | 126,275,956 |
| විදේශ විනිමය ලාභය/(අලාභය) | - | (2,789,303) |
| | 96,838,244 | 123,486,653 |
| අඩු කලා : ආපසු ගැනීම් | 69,306,668 | 89,185,062 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 27,531,576 | 34,301,391 |

**4.3 <u>චක්‍රීය අරමුදල් ගිණුම</u>**

ණය ගිවිසුමේ 111 ව්‍යවස්ථාවේ 4 (1) වගන්තිය අනුව 2011 අගොස්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ චක්‍රීය අරමුදල් ගිණුම විවෘත කර තිබුණි .2013 වර්ෂයේදී මෙම ගිණුමින් ප්‍රතිමූල්‍ය වියපැහැදම් ආරම්භකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී රුපියල් මිලියන 956 ක් ප්‍රතිමූල්‍යනය සඳහා ප්‍රදානය කර තිබුණි.

**5. <u>විගණන නිරීක්ෂණ</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**5.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකාරීත්ව තීරණවලට අනුකූල නොවීම.**

---

ව්‍යාපෘතියේ මෙහෙයුම් උපදෙස් වලට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තිමය කරුණු නිශ්චය කිරීමට හා සලකා බැලීමට ව්‍යාපෘතියෙහි මෙහෙයුම් කමිටුව තුන් මසකට වරක් ශ්‍රී ලංකා මහ බැංකුවේ දී රැස්විය යුතුය. එසේ වුවත් 2013 වර්ෂයේදී එක් මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**5.2 ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල.**

---

ප්‍රතිමූල්‍ය අයකර ගැනීම 2010 වර්ෂයේ සිට ආරම්භ කළ යුතුව තිබුණද ,දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යොජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු 2018 ජුලි 14 දක්වා වූ අවුරුදු 5 ක කාලසීමාවක් සඳහා පමණක් 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණි.